**අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**
**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**---------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**-------------------------------**

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 30 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 30 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 සැප්තැම්බර් 23 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
**-------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
---------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

සමාලෝචිත වර්ෂයේ අවසානයට විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.3,928,127 ක දායක මුදල් ගිණුම්ගත කර නොතිබුණි.

#### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්
**--------------------------**

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.82,534,463 ක් වූ ගිණුම් විෂයයන් 08 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර නිරීක්ෂණය වූ අසමානතා වල එකතුව රු.30,428,802 ක් විය.

#### 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
**-----------------------------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 2014 වර්ෂයේ සිට ලැබිය යුතුව තිබුණු රු.37,007,692 ක මූලධන ආධාර සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිරවුල් කර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) 2014 වර්ෂයේ සිට ඉදිරියට එන කර්මාන්ත සඳහා ගෙවිය යුතු රු.35,967,234 ක මුදල සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් කොන්ත්‍රාත්කරුවන් ඉල්ලුම් කර තිබියදීත්, නිරවුල් කර නොතිබුණි.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

එකතුව රු.144,839,179 ක් සම්බන්ධයෙන් වූ යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයද, රු.4,095,766 ක් වූ ගිණුම් ශේෂ සඳහා විස්තරාත්මක උපලේඛන ද, ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

### 1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත විස්තර දැක්වෙන නීති, රීති සහ රෙගුලාසි විධිවිධාන වලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය.

| නීති, රීති රෙගුලාසි යනාදියට යොමුව | | | අනුකූල නොවීම් |
|---|---|---|---|
| **(අ)** | **ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි** | | |
| | (i) | මුදල් රෙගුලාසි 104 | නැතිවීම් හා හානිවීම් පිළිබඳව පරීක්ෂණ පවත්වා, වගකිවයුත්තන් නිශ්චය කර නොතිබුණි. |
| | (ii) | මුදල් රෙගුලාසි 110 | හානි පාඩු ලේඛනයක අලාභය පිළිබඳව සටහන් තබා නොතිබුණි. |
| | (iii) | මුදල් රෙගුලාසි 571(1)(2) | වර්ෂ 02 ක කාලය ඉක්ම වූ එකතුව රු.2,589,322 ක් වූ තැන්පතු ශේෂ 68 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| | (iv) | මුදල් රෙගුලාසි 1645 - 1646 | සභාවේ වාහන 13 ට අදාළ දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛයේ 02 ඡේදය | | පිරිවැය රු.399,400 ක් වූ වාහන 03 ක් අපහරණය කිරීමට හෝ අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.18,771,710 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.10,331,101 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.8,440,609 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

**2.2 කාරක ප්‍රාග්ධන කළමනාකරණය**

ඉකුත් වර්ෂවලට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ජංගම සහ ක්ෂණික අනුපාතවල සුළු වර්ධනයක් පෙන්නුම් කෙරෙන බව නිරීක්ෂණය විය.

**2.3 ආදායම් පරිපාලනය**

**2.3.1 අක්කර බදු**

එකතුව රු.206,028 ක් වූ අක්කර බදු මුදලින් වර්ෂය තුළ අයකර තිබුණේ රු.6,093 ක් හෙවත් සියයට 03 ක් තරම් අවම අගයක් වූ අතර, වර්ෂය අවසානයට හිඟ ශේෂය රු.199,935 ක් වී තිබුණි. හිඟ මුදල් අයකර ගැනීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) වගන්තිය ප්‍රකාර සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

**2.3.2 කඩ කුලී**

ඉකුත් වර්ෂවලට සහ සමාලෝචිත වර්ෂයට අදාළව අයකර ගතයුතුව තිබුණු රු.1,059,164 ක් වූ බදුකුලී මුදලින් වර්ෂය තුළ සියයට 96 ක් අයකර ගැනීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට හිඟය රු.42,070 ක් විය.

**2.3.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.2,336,170 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.13,824,886 ක් ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) කාර්ය මණ්ඩල කළමනාකරණය පිළිබඳව පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 05 ක් පුරවා ගැනීමටත්, අතිරික්ත තනතුරු 22 ක් විධිමත් කර ගැනීමටත් කටයුතු කර නොතිබුණි.

(ii) ප්‍රාථමික කාණ්ඩයට අයත් සේවකයින් දෙදෙනෙකුට කළමනාකරණ සහකාර තනතුරේ රාජකාරි පවරා තිබුණු අතර, කම්කරුවන් දෙදෙනෙකුට රියදුරු සහ විදුලි කාර්මික රාජකාරි පවරා දී තිබුණි.

(iii) සේවය හැර ගිය හා විදේශගත සේවකයින් 11 දෙනෙකුගෙන් වර්ෂ 05 කට වැඩි කාලයක් තිස්සේ අය නොවී පවතින රු.36,624 ක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iv) 2015 සහ 2016 යන වර්ෂවල මීටියාගොඩ වෛද්‍ය මධ්‍යස්ථානයේ සේවය කල වෛද්‍යවරිය විසින් ලබාගෙන තිබූ වැටුප් රහිත නිවාඩු වෙනුවෙන් අයවිය යුතු රු.36,718 ක මුදලක් අයකර ගෙන නොතිබුණි.

(ආ) සභාව සතු බැංකු ජංගම ගිණුම් 03 ක සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති ශේෂවල එකතුව රු.6,994,907 ක් වූ නමුත්, එම මුදල් ආයෝජනය කර, අතිරේක පොලී ආදායම් උපයා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) හා (2) වගන්ති ප්‍රකාරව නාගරික පහසුකම් සහිත ප්‍රදේශ ලෙස හඳුනාගත් ප්‍රදේශවලින් වරිපනම් බදු අයකර ගැනීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 2014 දෙසැම්බර් මස මිලදී ගත් රු.558,990 ක් වටිනා ටයර් 20 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් ගබඩාවේ රඳවාගෙන තිබුණි.

(ආ) පිරිවැය රු.660,000 ක් වූ ගල් රෝලක් වසරක කාලයක් ද, කසල කළමනාකරණයට යොදවා තිබූ ගලිබවුසරයක් හා ට්‍රැක්ටර් 02 ක් වසර 02 ක කාලයක් තිස්සේ ද ධාවනයෙන් ඉවත් කර තිබුණි.

**3.3 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

නගර හා නගරාශ්‍රිත ප්‍රදේශ 04 කින් දිනකට එකතු වන ටොන් 3.5 ක ප්‍රමාණයක කසළවලින් නොදිරන කසළ දෙල්ගහබැද්ද නමැති ඉඩමේ පර්චස් 40 ක පමණ බිම් ප්‍රමාණයකට බැහැර කරන අතර, දිරන කසළ යොදාගෙන සතියකට පොහොර කිලෝ ග්‍රෑම් 100 නිෂ්පාදනය කරමින් පැවතුණි. නොදිරන කසළ භූමියේ විශාල වශයෙන් ගොඩගසා තිබුණු අතර, මෙම කසළවලින් අතිශය දුර්ගන්ධයක් වහනයවීම හා මැස්සන් හා මදුරුවන්ගේ ගහනය වැඩිවීමෙන් ජනතාවගේ සෞඛ්‍යයට අහිතකර බලපෑම් එල්ල වී ඇති බව නිරීක්ෂණය විය.

**4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**4.1 අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇතුළත් වියදම් විෂයයන් 05 ක එකතුව රු.8,246,073 ක ඉතිරිවීම් ද, වියදම් විෂයයන් 03 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන සීමාව ඉක්මවා රු.27,892,830 ක් වියදම් දරා තිබුණු අතර, ආදායම් විෂයයන් 02 ක අහිතකර විචලනයන්ගේ එකතුව රු.288,167 ක් වූ අතර, අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**4.2 අභ්‍යන්තර විගණනය**

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි විධිවිධාන හා පළාත් පාලන කොමසාරිස් (දකුණු පළාත) ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක : දපපා/යහ/01/නා.ව.ලේ දරන චක්‍රලේඛය ප්‍රකාර අභ්‍යන්තර විගණන නිලධාරියෙක් පත්කර තිබුණ ද, ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**4.3 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

2009 ජුනි 09 දිනැති අංක DMA/2009(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

**5. පද්ධති හා පාලනය**

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර විගණන විමසුම් මඟින් සභාවේ අවධානයට යොමු කරන ලදී. පහත විස්තර දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

| | පද්ධතිය | | පද්ධතියේ ප්‍රධාන අඩුපාඩු |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | ඉකුත් වර්ෂවල සිට ඉදිරියට එන ගිණුම් ශේෂ නිරවුල් කර නොතිබුණි. |
| | | (ii) | මූල්‍ය ප්‍රකාශනවල සහ ඊට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂ අතර පවතින වෙනස්කම් නිවැරදි කර නොතිබුණි. |
| | | (iii) | ගිණුම් ශේෂ අඩුවෙන් මෙන්ම වැඩියෙන් දක්වන ලද අවස්ථා පැවැතුණි. |
| (ආ) | ස්ථාවර වත්කම් | (i) | වත්කම් පන්ති අනුව වෙන් වෙන්ව විස්තර දැක්වෙන පරිදි ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| | | (ii) | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් සමීක්ෂණයක් පවත්වා නොතිබුණි. |
| | | (iii) | භාර නොදුන් පුස්තකාල පොත් ආපසු ලබා ගැනීමට හෝ අලාභ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | | (iv) | සභාව විසින් හානි හා පාඩු පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| | | (v) | සභාව සතු ආයුර්වේද බෙහෙත් ශාලාව හා උප කාර්යාලය යථා තත්ත්වයට පත්කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සේවක මණ්ඩල කළමනාකරණය | (i) | පුරප්පාඩු පුරවා ගැනීමට සහ අතිරික්ත සේවකයන් විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | | (ii) | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | | (iii) | විධිමත් පරිදි රාජකාරි පැවරීමක් කර නොතිබුණි. |
| | | (iv) | ආයුර්වේද හා උප කාර්යාලයට අයත් සේවකයින් ඵලදායී ලෙස අදාළ කාර්යයන්ට අනුයුක්ත කර නොතිබුණි. |
| (ඈ) | ආදායම් රැස්කිරීම | (i) | හිඟ ආදායම් අයකර ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. |
| | | (ii) | වරිපනම් බදු අයකර ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් ආරම්භ කිරීම ප්‍රමාද වෙමින් පැවතුණි. |
| | | (iii) | අක්කර බදු අයකළ හැකි ප්‍රදේශ හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | | (iv) | මුද්දර ගාස්තු සහ උසාවි දඩ මුදල් වැනි ආදායම් යාවත්කාලීනව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | | (v) | අතිරික්ත මුදල් ආයෝජනය කර, පොළී ආදායම් වැඩිකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඉ) | වාහන පාලනය | (i) | වාහන අළුත්වැඩියා සහ නඩත්තු ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| | | (ii) | දෛනික ධාවන සටහන්පත් සහ මාසික කාර්යසාධන සාරාංශ පිළියෙල කර නොතිබුණි. |
| | | (iii) | වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. |
| | | (iv) | අක්‍රීය තත්ත්වයේ පවතින වාහන අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. |
| | | | ටයර් නිකුත් කිරීමේ ලේඛනයක් පවත්වා නොතිබුණි. |